# කොරෝනා සහ දෙවියන්ගේ ලෙඩ

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
දයා අමරසේකර

# කොරෝනා සහ දෙවියන්ගේ ලෙඩ

කොරෝනා යන වදන අද සමාජයට හුරුවී ඇත්තේ 1. රෝගයක් 2. වසංගතයක් 3.ශාපයක් යන තුන් ආකාර වූ ප්‍රවේශයකිනි. රෝගයකට බෙහෙත් ඖෂධ පවතින අතර අවසන, රෝගය සුවපත් වීම දැකිය හැකි වීම සාමාන්‍ය සිදුවීමකි. එක් ඖෂධයකින් සුව නොවූ කල තවත් ඖෂධ හා වෛද්‍යවරුන් ඔස්සේ රෝග නිවාරණයට යොමුවේ. වසංගතය යන්න රෝගයක් මූලික කරගත් භෞතික නිශේධනීය විපර්යාසයකි. මිනිසාට මෙන්ම මිනිසා ඇසුරු කරන සතා,සිව්පාවුන්,ගහ කොල, ගංගා,ඇල දිය, ආදී සියල්ලම වසංගතයේ කුරිරු බලපෑම හසුවූ පීඩනයට ලක්වේ. මෙ පීඩනය හැඳින්වීමට දුර්භික්ෂය යන වචනය යොදනු දක්නට ලැබේ. ශාපයක් යන්න මේ දෙකටම වඩා වෙනස් වූවකි. එහි භෞතික - වාස්තවික හදුනා ගැනීමකට වඩා පවතින්නේ ආධ්‍යාත්මික බලපෑමකි. පැහැදිලිවම මේ බලපෑම මිනිසා ඇතුලු විශ්වය කරාම විහිද යා හැකි බලයක් සහිත බලපෑමකි.

අද අප මුහුණ දී සිටින්නේ මේ තුන් කොටසින් කුමකටද ? කියා නිදහස්ව කල්පනා කරන අය අද සිටීද ? මා සිතන්නේ එසේ නැති බවයි. සියල්ලන්ම හිතන ආකාරය තමා කේන්ද්‍ර කර ගත් (මානව කේන්ද්‍රිය) එකකි. ''මේක දරුණු රෝගයකි. මෙය මටත් වැළඳේද එසේ වුනොත් මාත් මගේ පවුලත් අසරණ වේවි.'' මේ අද අප සිතන හැටියි. මේ සිතිවිල්ල තුල ඇත්තේ අවබෝධාත්මක විඥානයක් නොවේ බිය, සැකය, අවිනිශ්චිත බව කැටිකරගත් මුලු ගැන්වීමකි. ඒ මුලු ගැන්වීම මූලිකව ආත්මාර්ථකාමී එකකි.

සැබවින්ම මෙය රෝගයක් නම් එයට පිළිවෙත්-ප්‍රතිකාර පැවැතිය යුතුයි. එහෙත් තවමත් මේ සඳහා නිවැරදි ඖෂධයක් සොයා ගැනීමට දියුණු යැයි කියන ලෝකයට නුපුලුවන් වී ඇත. දියුණු යැයි කියන ඒ ලෝකය නියෝජනය කරන ප්‍රධාන බල කඳවුරු දෙක ඇමරිකාව සහ චීනය අද මුලු මහත් ලොවෙහිම සිය අණසක පැතිරවීමට විවිධ ක්‍රමෝපායන් සිදු කරමින් සිටී. කොරෝනාව ආරම්භ වූවේද විශාල වශයෙන් මිය ගියේ ද මෙම බලවතුන්ගේ රටවලිනි. එසේ නම් මේ උවදුර රෝගයටකට වඩා වෙනස් වූවක්ද? දෙවියන්ගේ ලෙඩ යයි අපි හදුන්වනු ලැබූ රෝගයන් කීපයක් අපගේ මතකයට එන්නේ මෙතැනදීය.

දෙවියන්ගේ ලෙඩ ලෙස අප සලකු ලබන ලෙඩ වල ව්‍යවහාරික නම් එලෙසින්ම හැඳින්වීමටද අපේ ගැමියන් බියක් දක්වති. පැපොල, සරම්ප, කම්බුල්ගාය, ඒ අතර වේ. අපේ රටේ දැකිය හැකි මුල්ම දරුණු තම රෝග ව්‍යාප්තිය වූයේ වසූරියයි. මේ දරුණු දෙවියන්ගේ ලෙඩේ මුලු ලෝකයෙන්ම සඳහටම තුරන් කල බව 1981 දී නිල වශයෙන් ප්‍රකාශ විය. සැබැවින්ම වසූරිය දෙවියන්ගේ ලෙඩක් වන්නේ ඇයි ද යන්නට අර්ථ විග්‍රයක්

ජන ශ්‍රැතියක් ඇත. වසංගත රෝග සම්බන්ධ දේව යාදිනි, කන්නලව් වලදි කියවෙන වදුරු වසංගත යන වදනේ 'වදුරු' යන්න වසූරිය හැදින්වීමට යොදන ලද්දකි. කෝට්ටේ යුගයේදී ලියනු ලැබූ යෝග රත්නාකාරය නම් ආයුර්වේද ග්‍රන්ථයේද ඒ බව සනාථ කර ඇත. පැපොල, සරම්ප, කම්බුල්ගාය ආදී වසංගත රෝග දෙවියන්ගේ ලෙඩ ලෙස සැලකීමේ අරුතක් ඇත. එනම් මේවා ඇතිවන්නේ ජීව විද්‍යාත්මක හේතුවක් නිසා නොව දෙවියන්ගේ කෝපය නිසා බවය. ඒ නිසා එම රෝග සුව වීමට කළ යුත්තේ කන්නලව් යාදිනි හා පුද පිළිවෙත්ය. මෙහිදී මට මතක් වන්නේ බී. මැලිනොව්ස්කි නම් මානව විද්‍යාඥයා තමාගේ Magic Science Religion and other Essays කෘතියේ දැක්වූ අදහසකි. දෙවියන් කෝප වූ විට මිනිසුන්ගේ ලේ නහර රත්වේ. රත් පැහැ ගැන්වේ. සිරුරෙහි මැකී නොයන පැල්ලම් හට ගනී. එමගින් දෙවියන් පෙන්වා දෙන්නේ මිනිසාට තමා කළ වරදකට දඬුවම් විදීමට සූදානම් වෙනුය යන්නයි. මෙය එක්තරා ආකාරයක අභිචාර වල හොඳ සමාජ පාලන උපක්‍රමයකි.

සැබැවින්ම මෙසේ මිනිසුන් රෝගීන් කරවන දෙවිවරුන් කවුද යන්නද විමසුමට ලක් කළ යුත්තකි. මේ පිළිබඳ ඒකමතික තීරණයක් සමාජයේ නැත. මෙම සියලු වසංගත රෝග සුවපත් කිරීමේ සර්වාධිකාරී බලයක් 'පත්තිනි දේවිය' සතුව ඇතැයි විශ්වාස කළ පැරණි ගැමියන් සිටියහ. එහෙත් සිංහල ඒක සම්මතයට අනුව පත්තිනි දේවිය කන්නගි නම් මිනිස් ආත්මයක් ලැබ සිටි සමයේ තම සැමියා වන පාලඟ හෙවත් කෝවලන් නිරපරාදේ මරා දැමීම හේතු කොට ගෙන පඬි රජුට හා එම රටට කළ මහා ශාපය දැක ඉන් පසු කිසිවෙකුටත් ශාප නොකිරීමට තීරණය කළ බව පත්තිනි පුරා වෘත්තයේ පැහැදිලිවම සඳහන් වේ. ඒ අනුව පසක් වනුයේ විවිධ දෙවිවරුන් පතුරු වන ලද වසංගත රෝග සුවකිරීමේ කාර්යභාරය පමණක් පත්තිනි දේවිය සිය කැමැත්තෙන්ම භාර ගෙන ඇති බවයි.

කෙසේ වුවද මෙම 'දෙවියන්ගේ ලෙඩ' යන අදහස අපට තවත් පැත්තකින් විමසා බැලිය හැක. එනම් මේවා 'අම්මාවරුන්ගේ ලෙඩ' ලෙසද හැදින්වීමයි. මේ අම්මාවරුන් කවුරුන්ද? සෙලිග්මාන් සිය වැද්දන් පිළිබඳ කෘතියෙන් කියන්නේ අම්මා කිරි අම්මා කෙනෙක් බවද කිරි අමමාවරුන් අතරේ සිටින කුකුලාපල කිරිඅම්මා කුවේණිය ලෙස සැලකිය හැකි බවයි. කුවේණිය මෙහිදී පෙරට එනුයේද තවත් ජන ප්‍රවාදයක් සමගිනි. එනම් තමනට බලය ලබාගැනීමට උපකාරී වූ කුවේණි විජය කුමරු විසින් අනාථ කොට පලවාහැරීමේ ශාපයට කුවේණිය විසින් කරනු ලැබුවා යැයි කියන දිවි දෝෂ නිසා "වසූරිය" නම් වූ මාරාන්තික රෝගයක් පැතිර ගියේය යන ප්‍රවාදයයි.

මෙයින් පෙනී යන්නේ අපේ පැරණි සමාජය දෙවියන්ගේ ලෙඩ සත්‍ය වශයෙන්ම දේව ශාපයක් මූලික කරගෙන ඇතිවූවක්ය, එයට බෙහෙත් ඖෂධ නැත, කළයුතු

ප්‍රතිකාරය දේව යාදිනී හා පුද පිළිවෙත් පමණි යන්න තරයේ විශ්වාස කළ බවයි. මෙම විශ්වාසය තුළ අපට තවත් 'අධි භෞතික ශක්තීන් ඇති චරිතයන්ද හඳුනාගත හැක. සාමාන්‍යයෙන් පියවී ඇසට නොපෙනෙන දෙවියන් විසින් ඇති කළ වසංගත නිවාරණ කළ යුත්තේද මිනිසුන් අතර ජීවත් වන දේව බලයක් සහිත මිනිසෙකු විසින්ය යන විශ්වාසය එයින් මතුවේ. මෙම චරිතය 'දෙයියා' හෙවත් කිරි අත්තා නම් වෙයි. දෙවියන්ගේ ලෙඩක් නිවසේ කෙනෙකුට වැළඳුන පසුව කිරි අත්තාට ඒ නිවසට ගෙන්වන බවත් ඔහු දෙවියන් ලෙස මායම් වී ආරූඪයෙන් රෝගයට හේතුව පවසන බවත් පිළිගැනේ.ගෙදරක රෝගියෙක් සිටිනවා යන්න සෙසු සමාජයට දැක්වීමට කොහොඹ අත්තක් එල්ලා තිබීම පළමු කොට සිදු කිරිම වැදගත් කොට සැලකින. රෝගියෙකු සිටින නිවසට ඇතුළු වීමට පෙර ශාක යුෂ අන්තර්ගත උණුවතුරෙන් දෑත් පිරිසිදු කර ගැනීමද සිදු කරන අතර ශාක අත්ත එල්ලා තිබීම මගින් විෂබීජ ඇතුළුවීමක් සිදු නොවන අතර තවදුරටත් එම ස්ථානයේ විෂබීජ පැතිරීමක් ස්දු නොවනු ඇතැයි පැරැන්නන් විශ්වාස කලහ.ඉන්පසුව නිවසේ හතර කොනේ තහංචි ගල් වළලා ගෙවන්නට පිවසෙන කඩුල්ල හරහා වේලුව නමින් හැඳින්වෙන පිදුරු කඹයක් ඇද කඩුල්ලේ කොහොම අත්තක් එල්ලා එම නිවස ආරක්ෂා කරනු ලබයි. ඉන් පසුව රෝගිය කරා ගොස් ඔහු වෙනුවෙන් දේව කන්නලව්වක් කර රෝගය සුවවීමෙන් පසුව ප්‍රදේශයේ විහාරස්ථානයට කිරි ආහාර පූජාවක් කොට පත්තිනි දෙවියනට පින් පමුණුවා එම භාරයෙන් නිදහස් කිරීමට අණ කිරීම මොහුගේ කාර්ය විය. ඉන් පසු එළඹෙන්නේ සැබවින්ම නිරෝධායක කාලයකි. පිටස්තරයන් එම නිවසට ගෙන්වා නොගත යුතු අතර නිවසියන්ද පිටතට නොගිය යුතුය. දින දා හතරකට පසු රෝගියා නෑවීම කරනු ලබන අතර දින විසි එකකට පසු ගෙවත්තේ වැළලූ තහංචි ගල් ඉවත් කරනු ලැබේ. රෝගියා සම්බන්ධව අනුගමනය කල පිළිවෙත් චාරිත්‍රකුළස විශේෂ කරුණු රාශියක් හඳුනා ගත හැක රෝගියාට රෝගය වැලඳී දින 14 ක් ගත වූ පසු රෝගියා නැහැවීම එහිදිවිශේෂ කාර්යයකි. එම ජලයට ප්‍රතිශක්තිය වැඩෙතැයි විශ්වාස කරණ පැඟිරි කොළ, කොහොඹ කොළ, වැනි දෑ එකතු කරණ අතර රෝගියා පාවිච්චි කල ඇඳ සිටි රෙදි පුළුස්සා දැමීමද සිදුකරණු ලැබේ.එමෙන්ම රෝගියාගේ අහාර හා අවශේෂ කටයුතු සෙස්සන්ගෙන් වෙනස් වු විශේෂිත ක්‍රමයකට පැවතීමයි.මේ කාලයේ දී රෝගියාට මස්,මාළු වැනි පිළිහුඩු කෑම වගේම තෙල් කහ වැනි දෑ ද කෑමට එකතු නොකරීමද මිරිස් හොදි වැනි දෙයක් නිරන්තර ආහාර සමඟ මුසුකොට දීම ද දක්නට ලැබිණ. අනෙක් විශේෂිත කරුණ වුයේ රෝගය වැළඳීමෙන් රෝගියාට ඇති වූ මානසික බිඳවැටීමටද පැරැණි සමාජයේ පිළිවෙත් අතර තැනක් දී තිබීමයි. රෝගියාට කණ්නාඩියකින් මුහුණ බැලීම තහනම් වූ අතර, කණ්නාඩිය රෙද්දකින් ආවරණය කොට තබා තිබිණි. කණ්නාඩිය තුළින් තම මුහුණේ ඇති වෙනස්කම් දැක රෝගියා තුළ ඇතිවන කළකිරීම නැතිකර ගැනීමට මෙය කල බව පැහැදිලිය මෙහි දි සදහන් කල යුතු අනෙක් වැදගත් දේ නම් රෝගියා සහ එම නිවස සමග ගමේ ගැමියන් සහ සහයෝගීශීලි සම්බන්ධයයි.

දෙවියන්ගේ ලෙඩ ඇති රෝගියෙකු සිටි නිවසට අවශ්‍ය සියලු දේ ගැමියන් විසින් සැපයීම මෙහිදී අවධාරිත විශේෂ කරුණයි. එහෙත් නූතනයේ පවත්නා තත්වය මෙයට වඩා සම්පූර්ණයෙන් වෙනස්ය. කොරෝනා රෝගය වැළදීම පමණක් නොව රෝගය නොවැළදී නිරෝධායනයට ලක්වීමද භයානකය යන අදහසින් අදාල පුද්ගලයා ඈත් කොට තනි කොට තැබීමක් දක්නට ලැබේ. පැරණි සමාජයේ රෝගියා සුවපත් වූ විට ගමේ වෙද මහතා ගුරුන්නාන්සේ හෝ කපුරාල පැමිණ ඉහත දැක්වූ ලෙස දෙවියන්ගේ ගුණ සිහි කර මැතිරීමද පඬුරක් ගැසීමද දක්නට ලැබේ.

නූතනයේ විවිධ සමාජ මාධ්‍යයන් නිරෝධායනය ගැන කථා කරනු පෙනේ. අද එහි සරල අර්ථය වෙන් කිරීමකි. වෙන්වීමකි. එසේ වන්නේ විෂබීජ පැතිරයාම යන අර්ථයෙනි. එදා සමාජයේ එම වෙන්කිරිම අර්ථ දැක්වූයේ එසේ නොවීම දේව කෝපයට හේතුවේය යන විශ්වාසයෙනි. සම්ප්‍රදායක සමාජය තුළ පැවැති වැදගත් ගුණාංගයක් වූයේ දුක බෙදා ගැනීමයි. එය එක්තරා ආකාරයට සමාජ වගකීම් (Social Responsibility) ඉටුකිරීමට සෑදී පැහැදී සිටීමකි. එහෙත් නූතනයේ දක්නට ඇත්තේ මෙම සමාජ වගකීම් වෙනුවට පුද්ගලික වගකීම් (Personal Responsibility ) වෙනුවෙන් වෙහෙසෙන තත්වයකි. නූතන මිනිසාට වැදගත් වන්නේ තමා හා තම පවුලේ සිටින රෝගියෙකු පමණී. ඩර්කයිම් පෙන්වා දුන් පරිදි යාන්ත්‍රික ඒකාබන්ධ සමාජයේ සාමූහික විඥාණය මගින් පාලනය කළද ඓන්ද්‍රීය සමාජයේ පාලනය කරන්නේ ශ්‍රම විභජනය මගිනි. මේ තත්වය වෙනත් ආකාරයකින් හඳුනා ගැනීමට උක්ත පසුබිම තුළින් හැකිවේ.

එසේ නම් මෙම කොරෝනා උපදුර හුදු රෝගයකට වඩා ඒ හා බැදුනු සමාජ සංස්කෘතික කරුණු රාශියකින් යුක්ත ව්‍යයසනයක් සේ හඳුනා ගැනීම යුක්ති යුක්ත නොවේද ?